# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2371/14 - 2024 පෙබරවාරි මස 13 වැනි අඟහරුවාදා - 2024.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 2/1991

**(101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය**

(101 වන අධිකාරය) වූ සිවිල් නඩු විධාන සංග්‍රහයේ 214 වන වගන්තිය සමග කියවිය යුතු එකී සංග්‍රහයේ 840 වන වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ආචාර්ය **විජයදාස රාජපක්ෂ**,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2024 පෙබරවාරි මස 02 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2024 සිවිල් නඩු විධාන (ගාස්තු) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2024 මාර්තු මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. පාර්ශ්වකරුවකු සහ පාර්ශ්වකරුවන් අතර වන නැතහොත් ලේඛනගත නීතිඥවරයකු සහ සේවාදායකයකු අතර වන සියලු ගාස්තු බිල්පත්‍ර අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා විසින් මෙහි උපලේඛනයේ දක්වා ඇති අනුප්‍රමාණ අනුව තක්සේරු කරනු ලැබිය යුතු ය.

3. 2021 ජූලි මස 02 වැනි දින අංක 2234/67 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2021 සිවිල් නඩු විධාන (ගාස්තු) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.


1A - G 41420 — 56 (2024/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

[2 වන නියෝගය]

### *I වන කොටස*

**දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් පාර්ශ්වකරුවකු සහ පාර්ශ්වකරුවන් අතර වන නැතහොත් ලේඛනගත නීතිඥවරයකු සහ සේවාදායකයකු අතර වන ගාස්තු තක්සේරු කරනු ලැබිය යුතු අනුප්‍රමාණ**

| *අංකය* | *I වන තීරය* | *II වන තීරය* | | | |
|---|---|---|---|---|---|
| | *නඩු හෝ උත්තරවාද වර්ගගන* | *I වන පන්තිය* | *II වන පන්තිය* | *III වන පන්තිය* | *IV වන පන්තිය* |
| | | නඩු නිමිත්තේ, ඉඩම් හෝ දේපළ සඳහා වූ හිමිකමේ, බූදලයේ හෝ නඩුවේ විෂය වස්තුවේ වටිනාකම රු. 100,000/- කට අඩු වන අවස්ථාවක | නඩු නිමිත්තේ, ඉඩම් හෝ දේපළ සඳහා වූ හිමිකමේ, බූදලයේ හෝ නඩුවේ විෂය වස්තුවේ වටිනාකම රු. 100,000/- ක් වන හෝ රු. 100,000/- කට වැඩි සහ රු. 1,000,000/- කට අඩු වන අවස්ථාවක | නඩු නිමිත්තේ, ඉඩම් හෝ දේපළ සඳහා වූ හිමිකමේ, බූදලයේ හෝ නඩුවේ විෂය වස්තුවේ වටිනාකම රු. 1,000,000/- ක් වන හෝ රු. 1,000,000/- කට වැඩි සහ රු. 5,000,000/- කට අඩු වන අවස්ථාවක | නඩු නිමිත්තේ, ඉඩම් හෝ දේපළ සඳහා වූ හිමිකමේ, බූදලයේ හෝ නඩුවේ විෂය වස්තුවේ වටිනාකම රු. 5,000,000/- ක් වන හෝ රු. 5,000,000/- කට වැඩි වන අවස්ථාවක |
| 1. | නඩු පැවරීම, විත්ති වාචක ඉදිරිපත් කිරීම, මැදිහත් වීමට, අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර හෝ පුද්ගල ආකර්ෂකත්ව බලපත්‍ර හෝ ප්‍රොබේට් බලපත්‍ර හෝ ප්‍රදානය කිරීමට විරුද්ධ වීම හෝ වෙනත් යම් නඩු කටයුත්තක් පැවරීම සඳහා සේවාදායකයා සමග සාකච්ඡා කිරීම සහ උපදෙස් ලබා ගැනීම. | රු. 2,500/- | රු. 5,000/- | රු. 15,000/- | රු. 25.000/- |
| 2. | 1 වන අයිතමයේ නිශ්චිතව සඳහන් කාර්ය කිසිවක් සඳහා එක් එක් ලේඛනගත නීතිඥවරයාට දෙනු ලබන පෙරකලාසිය සහ නෛතික නියෝජිතයකු පත් කිරීම පිළියෙල කිරීම | රු. 2,000/- | රු. 2,000/- | රු. 2,000/- | රු. 2,000/- |
| 3. | එන්තරවාසිය | රු. 2,000/- | රු. 2,000/- | රු. 2,000/- | රු. 2,000/- |
| 4. | පැමිණිල්ල, උත්තරය, ප්‍රති උත්තරය, කරුණු දැක්වීම හෝ වෙනත් යම් උත්තරවාදයක්, පෙත්සමක් හෝ ඉල්ලීමක් කෙටුම්පත් කිරීම | රු. 3,000/- | රු. 6,000/- | රු. 9,000/- | රු. 12,000/- |
| 5. | නඩුව ගොනු කිරීම | රු. 1,000/- | රු. 2,000/- | රු. 3,000/- | රු. 4,000/- |
| 6. | විසඳිය යුතු ප්‍රශ්න සහ පිළිගැනීම්, ලේඛනවල ලැයිස්තුව සහ සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුව සකස් කිරීම | රු. 1,500/- | රු. 3,000/- | රු. 4,500/- | රු. 6,000/- |

| අංකය | I වන තීරය | II වන තීරය | | | |
|---|---|---|---|---|---|
| | නඩු හෝ උත්තරවාද වර්ගගත | I වන පන්තිය | II වන පන්තිය | III වන පන්තිය | IV වන පන්තිය |
| 7. | 11 වන අයිතමයේ නිශ්චිතව දක්වා ඇති කාරණා හැර අවසන් තීරණය ලබාදෙන තෙක් ලේඛනගත නීතිඥවරයාගේ පෙනී සිටීම (දිනක් සඳහා) | රු. 1,000/- | රු. 1,500/- | රු. 2,000/- | රු. 2,500/- |
| 8. | සිතාසි සහ දැන්වීම් කෙටුම්පත් කිරීම සහ ගොනු කිරීම | රු. 750/- | රු. 750/- | රු. 750/- | රු. 750/- |
| 9. | තීන්දු ප්‍රකාශය සහ ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාව කෙටුම්පත් කිරීම සහ ගොනු කිරීම | රු. 1,000/- | රු. 1,000/- | රු. 1,000/- | රු. 1,000/- |
| 10. | සාක්ෂිකරුවන් සඳහා වන සිතාසි හෝ දැන්වීම් (උපරිමය ලේඛන තුනක්) | රු. 500/- | රු. 500/- | රු. 500/- | රු. 500/- |
| 11. | නඩු විභාගය පැවැත්වෙන දිනවල දී පෙනීසිටීම ද ඇතුළුව සියලු අවශ්‍ය හෝ සාමාන්‍ය ඉල්ලීම් හෝ මෝසම් සානථ කිරීමට හෝ ඊට විරුද්ධවීමට නීතිඥවරයා අධිකරණයේ පෙනී සිටීම (දිනක් සඳහා) | රු. 3,000/- | රු. 4,500/- | රු. 6.000/- | රු. 7,500/- |
| 12. | ප්‍රොබේට් බලපත්‍ර, අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර, විචාරණ, හරස් විචාරණ, අධිකාර පත්‍ර, විශේෂ නඩු, ඉන්ජක්ෂන් තහනම්, තහනමට ගැනීම්, ප්‍රකාශන බැඳුම්කර, යොමු කිරීම්, කැඳවීම් නියෝග, දේපළ ලැයිස්තු, ගිණුම්, ගාස්තු බිල්පත්‍ර සහ එහි ශුද්ධ පිටපත් සකස් කිරීම, එක් පත් ඉරුවක් සඳහා (එක් ලේඛනයක් සඳහා සහ උපරිම වශයෙන් ලේඛන තුනක් දක්වා) | රු. 1,000/- | රු. 1,000/- | රු. 1,000/- | රු. 1,000/- |
| 13. | ලිඛිත දේශන | රු. 2,500/- | රු. 5,000/- | රු. 7,500/- | රු. 10,000/- |
| 14. | තක්සේරු කිරීම සහ නඩු ගාස්තු බිල්පත්‍ර සකස් කිරීම | රු. 1,500/- | රු. 1,500/- | රු. 1,500/- | රු. 1,500/- |

*සටහන* -(1) අධිකරණය විසින් සමාලෝචනය කිරීමට යටත්ව, රෙජිස්ට්‍රාර්වරයා විසින් යුක්තිසහගත යැයි සලකනු ලබන පරිදි පහත දැක්වෙන සැබෑ ලෙස දරන ලද වියදම් ගාස්තු ලෙස තක්සේරු කිරීමට ඉඩ දෙනු ලැබේ :-

(අ) නිල සාක්ෂිකරුවන්ගේ බටා (ඔවුන්ගේ ගමන් වියදම් ද ඇතුළුව) ;
(ආ) සිතියම්, මැනුම්, පිඹුරු හෝ අනුරූප සහ නඩු කටයුතු වාර්තා ; සහ
(ඇ) මුද්දර ගාස්තු.

(2) දිනයක් අයැද සිටින පාර්ශ්වය එකී දිනය වෙනුවෙන් ගාස්තුවකට හිමිකම් නොලබයි. (ලියාපදිංචි නීතිඥවරයා සහ නීතිඥවරයා යන දෙදෙනා ම)

### *II වන කොටස*

**1990 අංක 19 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන සමග කියවිය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සහ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් පාර්ශ්වකරුවකු සහ පාර්ශ්වකරුවන් අතර වන නැතහොත් ලේඛනගත නීතිඥවරයකු සහ සේවාදායකයකු අතර වන ගාස්තු තක්සේරු කරනු ලැබිය යුතු අනුප්‍රමාණ**

| *අංකය* | *I වන තීරය* | *II වන තීරය* | | | |
|---|---|---|---|---|---|
| | *නඩු හෝ උත්තරවාද වර්ගගන* | *I වන පන්තිය* | *II වන පන්තිය* | *III වන පන්තිය* | *IV වන පන්තිය* |
| | | නඩු නිමිත්තේ, ඉඩම් හෝ දේපළ සඳහා වූ හිමිකමේ, බූදලයේ හෝ නඩුවේ විෂය වස්තුවේ වටිනාකම රු. 100,000/- කට අඩු වන අවස්ථාවක | නඩු නිමිත්තේ, ඉඩම් හෝ දේපළ සඳහා වූ හිමිකමේ, බූදලයේ හෝ නඩුවේ විෂය වස්තුවේ වටිනාකම රු. 100,000/- ක් වන හෝ රු. 100,000/- කට වැඩි සහ රු. 1,000,000/- කට අඩු වන අවස්ථාවක | නඩු නිමිත්තේ, ඉඩම් හෝ දේපළ සඳහා වූ හිමිකමේ, බූදලයේ හෝ නඩුවේ විෂය වස්තුවේ වටිනාකම රු. 1,000,000/- ක් වන හෝ රු. 1,000,000/- කට වැඩි සහ රු. 5,000,000/- කට අඩු වන අවස්ථාවක | නඩු නිමිත්තේ, ඉඩම් හෝ දේපළ සඳහා වූ හිමිකමේ, බූදලයේ හෝ නඩුවේ විෂය වස්තුවේ වටිනාකම රු. 5,000,000/- ක් වන හෝ රු. 5,000,000/- කට වැඩි වන අවස්ථාවක |
| 1. | නීතිඥ ගාස්තු | රු.20,000/- | රු. 40,000/- | රු. 60,000/- | රු. 75,000/- |
| 2. | උපදෙස් දීම සඳහා වන ලියාපදිංචි නීතිඥවරයාගේ ගාස්තු | රු. 7,500/- | රු. 15,000/- | රු. 20,000/- | රු. 25,000/- |

*සටහන -* අධිකරණය විසින් සමාලෝචනය කිරීමට යටත්ව, රෙජිස්ට්‍රාර්වරයා විසින් යුක්තිසහගත යැයි සලකනු ලබන පරිදි පහත දැක්වෙන සැබෑ ලෙස දරන ලද වියදම් ගාස්තු ලෙස තක්සේරු කිරීමට ඉඩ දෙනු ලැබේ :-

(අ) නඩු කොපි ගාස්තු ; සහ
(ආ) මුද්දර ගාස්තු (අදාළ වේ නම්).

EOG 02 - 0094

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.